#  ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1688/30 – 2011 ජනවාරි 14 වැනි සිකුරාදා – 2011.01.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: 115/13/01/13.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 13/99/වීරි/257.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කරගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුම්පළාත පත්තුව නැගෙනහිර සුළු කොට්ඨාසයේ බලත්ගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද මු.පි.කෑ. 2779 දරන මූලික පිඹුරේ කැබලි අංක 01, 02 සහ 03 වශයෙන් පෙන්නුම් කරන ඉඩම්:

01. **කැබැලි අංක 01**
ඉඩමේ නම: අම්බුළුවාව වත්ත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 20.124.

02. **කැබැලි අංක 02**
ඉඩමේ නම: අම්බුළුවාව වත්ත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.247.

03. කැබැලි අංක 03
ඉඩමේ නම: අම්බුළුවාව වත්ත; හිමිකම් කියන අය: එච්. එම්. එම්. රාසික්, අම්බුළුවාව වත්ත, සිංහාපිටිය, ගම්පොල; ප්‍රමාණය: හෙක්. 2.462.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2011 පෙබරවාරි මස 21 වැනි දින පෙ. ව. 8.30 ට මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2011 පෙබරවාරි 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම, ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඒ. ඩබ්ලිව්. රුක්මණී ආරියරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මාවනැල්ල.

2011 ජනවාරි මස 07 වැනි දින,
මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 701


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.